12th Academic Sessions
University of Ruhuna, Matara, Sri Lanka
ISSN 2362-0412

# පහතරට වතු කම්කරුවාගේ පාරජාතික සංස්කෘතික ජීවිතය: කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ජීවත් වන දෙමළ ජනයාගේ ඇඳුම් පැළඳුම් සහ විලාසිතා ආශ්‍රයෙන් කෙරෙන සංස්කෘතික කියවීමක්

ඩබ්.ජී. අයෝමා දර්ශනී
*සිංහල අධ්‍යනාංශය, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය*

*wgadarshi@gmail.com*

**සාරසංක්ෂෙපය**

දකුණු ඉන්දියාවෙන් වතු වගාව සඳහා ශ්‍රී ලංකාවට ගෙන්වනු ලැබූ දෙමළ කම්කරු ප්‍රජාව පසු කාලීන ව බහුල වශයෙන් ශ්‍රී ලංකාවේ වතු වගා ප්‍රදේශ ආශ්‍රිතව ම පදිංචි වූහ. එකල සිට වර්තමානය දක්වා දකුණු පළාතෙහි සිංහල සහ දෙමළ ජනයා මිශ්‍රව ජීවත් වෙති. මුල් කාලීන ව ඔවුන් සතුව පැවැති සංස්කෘතිකාංග පසු කාලීන ව ක්‍රමයෙන් විපරිවර්තනයට ලක්ව ඇත් ද යන්නත් ඒ සඳහා බලපෑ සාධක ඇඳුම් පැළඳුම් හා විලාසිතා ආශ්‍රයෙන් විමර්ශනය කිරීමත් මෙම අධ්‍යයනයේ අරමුණ යි. කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි තෝරාගත් ගමක දෙමළ හා සිංහල ජනයාගේ ඇඳුම් පැළඳුම් කෙරෙහි අවධානය යොමු කරමින් සිදු කරන ලද සමීක්ෂණයක දත්ත මේ සඳහා යොදා ගන්නා ලදී. අධ්‍යයනය සඳහා දත්ත රැස් කිරීමේ දී දෙමළ ප්‍රජාව වයස් කණ්ඩායම් හතරකට වර්ග කෙරිණ. ඒ අනුව වර්තමාන දෙමළ තරුණ ප්‍රජාව අනුක්‍රමයෙන් ඔවුනට අනන්‍යව පැවති සම්ප්‍රදායික ඇඳුම් පැළඳුම් හා විලාසිතා සිංහල ජනයාගේ විලාසිතාවන්ට අනුරූප වන ලෙසින් වෙනස්කර ගැනීමට උත්සහ දරන බව පෙනෙයි. දෙමළ ස්ත්‍රී පාර්ශවයේ ප්‍රධාන ඇඳුම් වශයෙන් පැවැති සාරිය වෙනුවට බොහෝ දෙනා සාය, හැට්ටය අඳින අතර දෙමළ පුරුෂ පාර්ශවයේ ප්‍රධාන ඇඳුම වශයෙන් පැවැති සරම සහ කමිසය වෙනුවට කලිසම සහ කමිසය අඳිති. ඔවුහු අදට ද ඔවුන්ගේ ආගමික චාරිත්‍ර, මංගල අවමංගල උත්සව චාරිත්‍ර ආදිය සාම්ප්‍රදායික ක්‍රමයට අනුගත වෙමින් සිදු කළ ද ඇඳුම් පැළඳුම් හා විලාසිතා සම්බන්ධයෙන් විශාල විපරිවර්තනයක් දක්නට ලැබේ. සාහිත්‍ය මූලාශ්‍රය, ක්ෂේත්‍ර සමීක්ෂණ සහ සමීක්ෂණ දත්ත මෙහි දී යොදා ගන්නා ලදී.

*ප්‍රමුඛ පද: වතුකම්කරුවා, දෙමළ ජනයා, ඇඳුම් පැළඳුම්, සංස්කෘතිය මිශ්‍රවීම*